*සැ. යු.* - 2023.06.02 දින පළ කර ලද අංක 2335 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,336 - 2023 ජුනි මස 09 වැනි සිකුරාදා - 2023.06.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | — |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 202 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 ජුනි මස 30 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 ජුනි මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/70404.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* SPLC/MAT/4/24/9/97.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 241 A කිරිවැල්දොළ ග්‍රාම නිලධාරී වසමේ කිරිවැල්දොළ ගමේ ජනපද නිලධාරී විසින් සකස් කරන ලද දළ අනුරේඛනය මගින් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.510 ක් වූ රජයේ ඉඩම් කැබැල්ලක් කෘෂිකාර්මික කටයුතු සඳහා කීරිවල ගමගේ නිහාල් අමරවීර විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාර්ගය සඳහා වෙන් කළ බිම (C කැබැල්ල), |
| *නැගෙනහිරට* | : | අ.ග.පි. 125/17, කැබැල්ල, |
| *දකුණට* | : | මෙම ඉඩමේ E දරන කැබැල්ල, |
| *බටහිරට* | : | මාර්ගය සඳහා වෙන් කළ බිම (C කැබැල්ල) සහ මෙම ඉඩමේ E දරන කැබැල්ල. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසිවලට යටත්කොට ඉඩම් බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2023.03.31 දින සිට 2053.03.30 දක්වා)

*(ආ)* *වාර්ෂික බදු මුදල*.- 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2023 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2%කි. 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල :* වාර මුදලක් අය නොකෙරේ.

*(ඇ)* මෙම ඉඩම කෘෂිකාර්මික කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය,

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත්ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය,

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඊ)* සාදා ඇති /සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* බද්ද ක්‍රියාත්මක වන 2023.03.31 දින සිට වසර 05ක අවම කාලයක් ඉක්මවීමට පෙර අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එම්. එච්. ඒ. ටී. මධුශානි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2023 මැයි මස 26 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

06 - 156

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/56594.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* UPLC/L/14/HP/L/74.

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

බදුල්ල දිස්ත්‍රික්කයේ, හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 63බී, දියතලාව ග්‍රාම නිලධාරී වසමේ දියතලාව ගමේ අංක 01/2017 අනුරේඛනයේ කැබලි අංක A මගින් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0481ක් වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුත්තක් සඳහා විජේසුන්දර මුදියන්සේලාගේ සුජිත් ධම්මික විජේසුන්දර මයා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

*උතුරට* : අංක 1962- A අනුරේඛනයේ කැබලි අංක 1,
*නැගෙනහිරට* : රජයේ ඉඩම (කැබලි අංක 1379 ඉතිරි කොටස),
*දකුණට* : රජයේ ඉඩම (කැබලි අංක 1379 ඉතිරි කොටස),
*බටහිරට* : ටී. පී. පී. එස්. 28 හි කැබලි අංක 1378 සහ මාර්ගය.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(අ) *බදු කාලය*.- අවුරුදු තිහයි. (30) (2023.03.31 දින සිට ඉදිරියට)

(ආ) *වාර්ෂික බදු මුදල*.- 2023 වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 2%කි. 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල* : වාර මුදලක් අය නොකෙරේ.

(ඇ) මෙම ඉඩම වාණිජ කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය,

(ඈ) මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම්ගේ සිතගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය,

(ඉ) පළාත් ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතු ය.

(ඊ) සාදා ඇති /සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

(උ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(ඌ) 2023.03.31 දින සිට වසර 05ක් ගතවන තුරු අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(එ) බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට*.

2023 මැයි මස 29 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

06 - 201

---

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/63489.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* LCD/16/LND/28/02/FI/48.

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 7129, රිදියගම ග්‍රාම නිලධාරී වසමේ රිදියගම ගමේ LCD/10/06/FI/01/2019/09-20 දරන අනුරේඛනයේ කැබලි අංක 2 දැක්වෙන ප්‍රමාණයෙන් පර්. 06ක් වන රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා කෝට්ටේ ආරච්චිගේ දයාරත්න මයා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

*උතුරට* : අතුරු මාර්ග රක්ෂිතය හා ළමා උද්‍යානය සඳහා වෙන් කළ ඉඩම,
*නැගෙනහිරට* : මාර්ග රක්ෂිතය හා ළමා උද්‍යානය සඳහා වෙන් කළ ඉඩම,
*දකුණට* : මාර්ග රක්ෂිතය,
*බටහිරට* : ළමා උද්‍යානය සඳහා වෙන් කළ ඉඩම.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2023.01.17 දින සිට වසර 30ක් ඉදිරියට)

*වාර්ෂික බදු මුදල*.- 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 2%කි. 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොල වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර එය කළින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල* : වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුනු දින සිට අවුරුදු 01ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය,

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය,

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2023.01.17 දින සිට වසර 05ක් ගත වන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහාවන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* නිවේදනය පළ කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2023 මැයි මස 12 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

06 - 202

---

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/60400.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* UPLC/L/5/BW/L-238.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 67සී, අඹේගොඩ ග්‍රාම නිලධාරී වසමේ, අඹේගොඩ ගමේ අ. ග. පි. 116 පිඹුරේ කැබලි අංක 547 න් කොටසක් දැක්වීමට අඳින ලද අංක B/BND/2012/068 අනුරේඛනයේ කැබලි අංක A මගින් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0252 ක් වූ ඉඩම් කොටස සමිති කටයුතු සඳහා බණ්ඩාරවෙල විවිධ සේවා සමූපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

*උතුරට* : මාර්ග රක්ෂිතය,
*නැගෙනහිරට* : මාර්ග රක්ෂිතය හා ඒ. විජේරත්නගේ ඉඩම,
*දකුණට* : ඒ. විජේරත්නගේ ඉඩම හා මාර්ග රක්ෂිතය,
*බටහිරට* : මාර්ග රක්ෂිතය.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2023.04.11 සිට 2053.04.10 දක්වා)

*වාර්ෂික බදු මුදල*.- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 2023 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුනු දින සිට අවුරුදු 01ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය,

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම සමිති කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය,

(ඈ) ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතු ය.

(ඉ) සාදා ඇති/ සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(උ) බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10%ක දඩ පොලියක් අය කරනු ලැබේ.

*ගැසට්* පත්‍රයේ පළ කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම්. සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට*.

2023 මැයි මස 16 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

06 - 216

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/68047.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* : SPLC/GAL/4/11/3/166

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

ගාල්ල දිස්ත්‍රික්කයේ, නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසට අයත් 233, බටුවංගල ග්‍රාම නිලධාරි වසමේ බටුවංගල ගමේ අ.ග.පි. 472 හි කැබලි අංක 805 දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0506ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් වාණිජ කටයුතු සඳහා ලංකා විදුලි බල මණ්ඩලය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

*උතුරට* : කැබලි අංක 804,
*නැගෙනහිරට* : කැබලි අංක 801,
*දකුණට* : කැබලි අංක 807,
*බටහිරට* : කැබලි අංක 807 හා 804.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2022.06.30 දින සිට ඉදිරියට)

*වාර්ෂික බදු මුදල*.- බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 2%කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

(ආ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය,

(ඇ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය,

*(ඈ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2022.06.30 දින සිට වසර 05ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* පත්‍රයේ පළ කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එම්. එච්. ඒ. ටී. මධුශානි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2023 මැයි මස 16 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැඳුර'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

06 - 217

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.